කවරෙකු අල්ලාහ්ගේ වදන උසස් වනු පිණිස ජිහාද් කරන්නේ ද ඔහුය අල්ලාහ්ගේ මාර්ගයේ සිටිනුයේ" යැයි පවසා සිටියහ

අබූ මූසා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. නිර්භීතව සටන් වදින,
ප්රදර්ශන නිරීම සඳහා සටන් වදින සහ කුහක කමින් සටන් වදින මිනිසා පිළිබඳව සඳහන් කර,
එයින් අල්ලාහ්ගේ මාර්ගයේ සටන් වැදීමක් වනුයේ කවර කරුණක් දැයි? අල්ලාහ්ගේ දූතයාණන්ගෙන් විමසන ලදී. එවිට අල්ලාහ්ගේ දූතයාණෝ: "කවරෙකු අල්ලාහ්ගේ වදන උසස්
වනු පිණිස ජිහාද් කරන්නේ ද ඔහුය අල්ලාහ්ගේ මාර්ගයේ සිටිනුයේ" යැයි පවසා සිටියහ. [صحيح] [متفق عليه]

සටන්කරුවන් දෙදෙනෙකුගේ අරමුණුවල ඇති වෙනස ගැන නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ගෙන් විමසන ලදී. එනම් කවරෙකු නිර්භීතකම හෝ ප්රදර්ශන කිරීමට හෝ මිනිසුන් අතර යම් නිලයක් ලබන්නට අපේක්ෂාවෙන් හෝ වෙනත් අරමුණු උදෙසා හෝ සටන් වදින්නේ ද එවැන්නන් අතරින් අල්ලාහ්ගේ මාර්ගයේ පිහිටනුයේ කවර කරුණක සටන් වදින්නාද? යැයි විමසන ලදී. එවිට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ "සැබැවින්ම අල්ලාහ්ගේ මාර්ගයේ සටන් කරන්නා යනු අල්ලාහ්ගේ වදන උසස් වනු පිණිස සටන් කරන්නාය" යැයි දන්වා සිටියහ.

http://www.sunnah.global/hadeeth/si/show/2969